## 2019 මැයි මස 12 වන දින සිට 2019 මැයි  මස 19 වන දින දක්වා
## ප්‍රශංසා එකතු සුපුවත

**ප්‍රාණ පරිත්‍යාගී රුධිරය අපගේ ඇදහිල්ලේ ශක්තයයි**

01. ආරම්භක ප්‍රශංසාව :
    පුබුදු ගී අංක 03  "ආ එනු මැනේ..."

02. ප්‍රශංසාවට යොමුව :        හෙබ්‍රෙව් 12:1-2

**"මේ සා විශාල සාක්ෂිකාර සේනාවකින් අප වට වී සිටින නිසා, සියළු අවහිර ද, පහසුවෙන් අප වෙළා ගන්නා පාපයන් ද ඉවත ලා, ඇදහිල්ලේ කර්තෘවරයාණන් ද එහි පරිපූරකයාණන් ද වන  ජේසුස් වහන්සේ දෙසම  නෙත් යොමා, අපට දිවීමට ඇති ධාවනය නොපසුබට, වීර්යයෙන් දුවමු. ....."**

පුබුදු ගී අංක 129  "පූර්ණයාණෙනි ඔබ දකින තුරා...."

03. දවසේ සුපුවත :  ක්‍රියා 7:59-60

**"ජේසුස් ස්වාමින් වහන්ස, මාගේ ආත්මය පිළිගත මැනව යි කියා ස්තේපන් යාච්ඤා කරද්දී ඔවුහු ඔහුට ගල් ගැසීය.  ඔහු දණින් වැටී, 'ස්වාමින් වහන්ස, මේ පාපය ඔවුන් පිට නොතැබුව ද මැනව'යි මහා හඬින් මොර ගසා  කීය..."**

ශු.ලූක් 23:34  **" පියාණනි, ඔවුන්ට කමා වුව මැනව, ඔවුන් කරන දෙය ඔවුහු නොදනිති යි වදාළ සේක.**

* ඉහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨ තුළින් අනාවරණය වන කිතුනු දිවියේ සුවිශේෂී ලක්ෂණයන් මොනවාදැයි ළඟ සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න.

04. වචනයේ සේවකයා සඳහා :

* මනුෂ්‍ය පුත්‍රයාණන් ලෙස සමිඳාණන් වහන්සේ අත්දුටු  කඨෝරවූ ද, වේදනාත්මකවූ ද අත්දැකීම තුළම  සමාව දීමේ වරප්‍රසාදය ලැබුවේ පියාණන් වහන්සේගේ ප්‍රේමය පූර්ණව අත්දුටු නිසාය.
* සමාව දීම යනු ප්‍රේමයේ ගැඹුරුම ප්‍රකාශනයයි.  විශ්වාසය, ප්‍රේමය, බලාපොරොත්තුව පියාණන් වහන්සේ තුළම තැබුවාවූ සමිඳාණන් වහන්සේ කොන්දේසි විරහිතව සමාව දීමේ, ප්‍රේම කිරීමේ අවැසිතාවය වටහා දුන්නේ කුරුස ගසේදී සිය ජීවිතය පුද කිරීමෙන් ය.
* පළමුවන ප්‍රාණපරිත්‍යාගී වරයා වූ ශුද්ධවූ ස්තේපන් මුනිතුමා ද සිය ආත්මය පියාණන් වහන්සේට පිළිගන්වමින් යාච්ඤා කරන ලද්දේ, 'ස්වාමින් වහන්ස, මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනව'යි කියාය.
* තමන්ව ගල් ගසා මරා දැමුවන් හට කිසිදු කොන්දේසියකින් තොරව සමාව දෙන්නට, ප්‍රේම කරන්නට ස්තේපන් මුනිතුමාට ද හැකි වූයේ තම විශ්වාසය, ප්‍රේමය,බලාපොරොත්තුව ක්‍රිස්තුන් වහන්සේ තුළම තැබූ නිසා ය.

05. අප දෙසට :

* උත්ථාන සමයේ සතරවන සතියට පා තබා සිටින අපද දෛනික ජීවිතය තුළ කාලීන සිදුවීම් තුළ උත්ථාන වූ සමිඳුන් හමුවීමේ බලාපොරොත්තුවෙන් පසුවන්නන්  වමු.
* පාස්කු ඉරුදායින් ආරම්භ වූ උත්ථානයේ සමය තුළ  රටක් ලෙස අප මුහුණ දුන් ඒ අමිහිරි සේම බේදජනක අත්දැකීම තුළ උත්ථාන වූ සමිඳාණන් වහන්සේගේ වැඩ සිටීම අත්දකින්නට ඔබට / මට හැකිවීද?
* උත්ථානයේ බලය අත්දකින්නට දේවස්ථානය කරා පා නැගූ කිතුනුවන් හට මුහුණ පාන්නට වූයේ ඔවුන් නොසිතූ මරණීය අත්දැකීමකට ය.  එහෙත් මරණයෙන් කෙළවර නොවන සදාතනික ජීවිතයකට උරුමකම් කියන්නට ඔවුන් ලද ආශිර්වාදය ප්‍රාණ පරිත්‍යාගීන් ලෙස අප දේශය වෙනුවෙන් දෙවිඳුන් ඉදිරියෙහි පෙනී සිටීමේ භාග්‍යයයි.
* මෙලෙස ප්‍රාණපරිත්‍යාගී වූ ඔවුන් සමඟ මේ සියළු සිදුවීම්වලට මුහුණ දුන් අප සියළු දෙනාද අප තුළ වැඩ වසන උත්ථාන වූ සමිඳාණන් වහන්සේ සමඟින් සමාව දීමේ ප්‍රේමය අත්දකින්නට පියවර තබමු.

* සිදුවීම් හමුවේ සැබෑ කිතුනුවන් ලෙස සාක්ෂි දරන්නට අපට හැකිවීම ගැන ඔබ ප්‍රීති වූවාද? නොඑසේ නම් වෛරය, පලිගැනීම, කලහකාරිත්වය සිත තුළ තබා ගෙන සාක්ෂි දැරීම අමතක කළා ද?
* වර්ථමානයේ සිදුවූ මෙම තත්ත්වය හමුවේ පුබුදු ජනතාවක් ලෙස අපට ලැබුනු වචනය තුළ ජීවත් වීමට අප අවදි වෙමු.
  - දිනපතාම මගේ පැය අපේ ප්‍රමුඛතාවය කර ගනිමු.
  - නිරන්තරයෙන් ශුද්ධාත්මයාණන්ට අවදි වෙමු.
  - දේව වචනය මෙනෙහි කරමු.
  - හැකි අයුරින් කිහිප දෙනෙකු සමඟ අත්දැකීම් බෙදා ගනිමු.
  - සුභාරංචිය ප්‍රකාශ කිරීම අපගේ වගකීම හා කැඳවීම බව අවබෝධ කර ගනිමු.

06. අවසාන ප්‍රශංසාව :
පුබුදු ගී අංක 70 "කිතුන් වහන්සේ මරණය ජය ගෙන ...."

=======================

## 2019 මැයි මස 19 වන දින සිට 2019 මැයි මස 26 වන දින දක්වා
## ප්‍රශංසා එකතු සුපුවත

### අපගේ ඇදහිල්ලේ ස්ථිර පදනම ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයයි

01. ප්‍රශංසාව සඳහා :
* පාස්කුව නොහොත් එතෙරවීමේ සමයේ අළුත් ජීවිත පැවැත්මක් ගැන අපි කථා කළෙමු. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය කරණ කොට ගෙන සියල්ල නවතාවයකට පත්වී ඇතැයි අපි තරයේ අදහන්නෙමු. සැබවින්ම දැන් සියල්ල අළුත් වී ඇත.
* එළිදරව් ලිපියේ 21:4 වගන්තියේ සඳහන් හෙළිදරව්ව මෙම උත්'ථාන සමයටද යෝග්‍යයය. "ඔවුන් වහන්සේ ඔවුන්ගේ දෙනෙත්වල සියළු කඳුළු පිස දමන සේක. මරණය තවත් නැත. වැලපීම ද, හැඬීම ද , වේදනාව ද තවත් නැත. පළමු පිළිවෙල පහව ගියේය."
* දෙවි මහෝත්තමයාණන්ගේ මෙම මහිමාන්විත ක්‍රියා මුල් කරගෙන, මුළු හදවතින්ම තුති ප්‍රශංසාවේ යාගය ඔවුන් වහන්සේට පුද කරමු.
* පුබුදු ගී 226 "දුටු සඳින් මා...."

02. පසුගිය සතියේ අත්දැකීම් බෙදා ගනිමින් ප්‍රශංසා කරමු.

03. සතියේ සුපුවත : (උත්ථාන සමයේ පස්වන ඉරුදිනට නියමිත ශුද්ධ ලියවිලි පාඨ මෙනෙහි කරමු)

i පළමුවන දේව ප්‍රකාශනය - ක්‍රියා 14:21-24

* ඉහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨය කියවා උත්ථානයෙන් පසු ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳව අපෝස්තුළුවරුන්ගේ අත්දැකීම ඔවුන්ගේ ජීවිත පිළිවෙල කෙසේදැයි බෙදා ගන්න.
* විශේෂයෙන් මෙහි පහත සඳහන් වගන්ති කෙරෙහි විශේෂ අවධානය යොමු කරන්න.
  - i ඔවුහු ඒ නුවර සුබ අස්න දේශනා කොට බොහෝ දෙනෙකු ගෝලයන් කරන්න....
  - ii අප බොහෝ දුක් විඳිමින් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වන්නට ඕනා යයි කියා, ශ්‍රාවකයන් ධෛර්යමත් කර ....
  - iii ඇදහිල්ලේ ස්ථිරව පවතින්නට ඔවුනට අවවාද කළහ.
  - iv ඔවුහු එක් එක් සභාවේ (සංඝයේ) සැදැහැවතුන් කෙරෙහි සභා මූලිකයන් පත් කොට උපවාසයේ යෙදී යාච්ඤා කර..... සමිඳාණන් වහන්සේට ඔවුන් භාර දී......

ii සුවිශේෂ ප්‍රකාශනය - ශු.ජොහාන් 13:31-35

* ක්‍රිස්තුන් වහන්සේ සැබවින්ම තම ශ්‍රාවකයන්ගේ දුර්වලකම් දැන සිටියහ. එසේ ඔවුන් වහන්සේ ඔවුන්ට ප්‍රේම කළා. කොපමණ දුබල වුවද තමන් වහන්සේ විසින් තෝරාගත් ශ්‍රාවකයන් ඔවුන් වහන්සේව අත්හැර ගියද, ඔවුන් වහන්සේ ලුහුබඳින ප්‍රේමයකින් ඒ දුබලයන්ට ප්‍රේම කළා.

* බලන්න සිදුවන්නට යන සියල්ලක් දැන ගෙන ක්‍රිස්තුන් වහන්සේ අපෝස්තුලවරුන්ගෙන් සමු ගත්තේ කෙසේද? "දරුවෙනි කියා ඔවුන් අමතමින් මනුෂ්‍ය පුතෙකු ලෙස ආවේගශීලී යුතු මොහොතක ඔවුන් වහන්සේ ඔවුන් අමතනු ලැබුවේ ප්‍රේමණීය වූ මෘදු වූ ස්වභාවයකින්.
* ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමය තමාට සතුරුකම් කරන්නා පවා ආදරයෙන් වැළඳ ගන්නා ප්‍රේමයක්.

04. ප්‍රායෝගික වීම සඳහා :

i සැම විට සැම තැන සියළු කාරණා වලදී උත්ථානයේ සුබ අස්න වෙනුවෙන් සාක්ෂි දැරීම සඳහා ඇදහිල්ලේ ස්ථිරව පවතිමු.
ii එකිනෙකාගේ පාද සෝදමින් (සමාව දානය කරමින්) ආත්මාර්ථයෙන් තොරව භේදයකින් හා කෝන්දේසියකින් තොරව ප්‍රේම කරන්නට පටන් ගනිමු.
iii එවිට අළුත් අහසක් අළුත් පොළොවක් නිර්මාණය වන බව අදහා ගනිමින් නව නිර්මාණයට දායක වෙමු.
iv අනාගතය කෙසේ වෙයිදැයි යන්න අපි බොහෝ විට දකින්නේ අප සතු සීමිත බුද්ධියෙනි. එහෙයින් මරණය මරා ජය ගනිමින් උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ මත අපි ඇදහිල්ලේ ස්ථිරව පවතිමු.

05. අවසාන ප්‍රශංසාව :
* සියළු ජන කොටස් හා විවිධ ආගම් අදහන අප දේශයේ ජනතාව වෙනුවෙන් යාච්ඤා කරමු.
* පුබුදු ගී අංක 103 "තුති ප්‍රශංසා වේ......"

===========================

**2019 මැයි මස 26 වන දින සිට 2019 ජූනි මස 02 වන දින දක්වා**
**ප්‍රශංසා එකතු සුපුවත**

**"ලොව පුරා ගොස් සකල සත්ත්වයා හට සුබ අස්න දේශනා කරන්න"**

01. ආරම්භක ප්‍රශංසාව :
පුබුදු ගී අංක 10 "ශුද්ධාත්මයාණෙනි...."

02. ප්‍රශංසාවට යොමුව :
**"දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නන් හට ඔවුන් වහන්සේ සූදානම් කර ඇත්තේ කිසිවෙකු කවදාවත් ඇසින් නුදුටු, කනින් නොඇසූ, සිතින් නොසිතූ දෙයකි. "** (1කොරෙන්ති 2:9)

* දෙවියන් වහන්සේ ප්‍රේමයයි. ඔවුන් වහන්සේට ප්‍රේම කරන්නන් හට ඔවුන් වහන්සේ දක්වන ප්‍රේමය මනුෂ්‍ය බුද්ධියට නොතේරෙයි. එය අභිරහස්මකයි. අපට අයහපතක් ලෙස දැනෙන, පෙනෙන සියළු තත්ත්වයන් හමුවේ ඔවුන් වහන්සේ අභිරහස්මක ලෙස අපට ප්‍රේම කරන සේක. අප අකමැති දෙය, අප නොසිතන දෙය, අප බලාපොරොත්තු නොවන දෙය අප තුළ සිදුවන්නට ඉඩ හරිමින් අපට ප්‍රේම කරන දෙව් මහෝත්තමයාණන් ඉදිරිපිට පෙනී සිටිමින් අද දවසේ ප්‍රශංසාවට ඇතුළු වෙමු.
පුබුදු ගී අංක 134 "පරම අපරිමිත...."

03. දවසේ සුපුවත : ශු.මාක් 16:14-17

* ඔබ සවන් දුන්, මෙනෙහි කළ ශුද්ධ ලියවිලි පාඨය හරහා අනාවරණය වන සමිඳාණන් වහන්සේ පිළිබඳව හා ශ්‍රාවකයන්ගේ අත්දැකීම ළග සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න.

04. වචනයේ සේවකයා සඳහා :
* උත්ථාන වූ පසු තමන් වහන්සේව දුටුවන් කීදේ නොඇදහූ තම ශ්‍රාවකයන් පිළිබඳ ඔවුන් වහන්සේගේ හදවතෙහි ඇතිවූයේ වේදනාවක් විය හැකිය. ඔවුන්ගේ අවිශ්වාසය, සිත් දැඩිකම ගැන ඔවුන්ට දොස් පැවරුවේ ඒ නිසාය.

* උත්ථානය විශ්වීය අත්දැකීමකි. මරණය පරාජය කරමින් උත්ථානවූ සමිඳාණන් වහන්සේ ලොව පුරා ගොස් සකල සත්ත්වයා හට සුබ අස්න දේශනා කරන්නැයි තම ශ්‍රාවකයන්ට ආරාධනා කරනුයේ ද උත්ථානයේ බලය මුළු විශ්වය පුරාම ප්‍රකාශ විය යුතු නිසාය.
* විශ්වාසය ජීවිත තුළ සිදු කරන ප්‍රබල ක්‍රියා ජීවිතයෙන් අත්දකිමින් සාක්ෂි දරන්නට උත්ථානයේ බලය අත්දැකිය යුතු බව මින් පැහැදිලි වේ.
**"අදහන්නන් ඇසුරු කොට ගත් හාස්කම් මේය."** (ශු.මාක් 16:17-18)

05. අප දෙසට :
* උත්ථාන වූ සමිඳාණන් වහන්සේව හමු වූ කිතුනුවන් වන අප, අපට හමු වූ සමිඳාණන් වහන්සේ පිළිබඳ බලගතු අත්දැකීම සකල ජනයා හට දේශනා කරන්නන් විය යුතුම ය. එය අපේ කැඳවීමය, වගකීමය.
* මේ මොහොත වන විටත් අප රටේ පවතින තත්ත්වය හමුවේ උත්ථාන වූ සමිඳාණන් වහන්සේව හමුවන කිතුනු අනුගාමියෙකු ලෙස ඔබ / මම කොතැන ද?
* සිදුවීම හමුවේ අප එඬේරාණන් ක්‍රියා කළ අන්දම, ප්‍රකාශ කළාවූ වචන කිතුනු අපගේ විශ්වාසය රටට ප්‍රකාශ වූ අවස්ථාවක් නොවේද? කිතුනු විශ්වාසය අන්‍ය ආගමිකයන්ගේ ජීවිත තුළට ආලෝකයක් වන්නට බලපෑ මොහොතක් වූවා නොවේද? උත්ථාන වූ සමිඳාණන් වහන්සේගේ වැඩසිටීම, ක්‍රියාකාරිත්වය ප්‍රකාශ වූ ප්‍රබල අත්දැකීමක් නොවේ ද? සකල සත්ත්වයා හට ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයේ බලය ප්‍රකාශ වූ මොහොතක් නොවේ ද?
* මේ යුගයේ වත්මන් තත්ත්වය තුළ අප දේශය තුළ සුබ ආරංචිය ප්‍රකාශ කරන්නට අපට ලැබී ඇති අවස්ථාව මග නොහරිමු. භීතියට පත්ව ඇති, කැළඹී ඇති අප සහෝදරයන් වෙතට ගොස් ඔවුනට සැනසිල්ලක් වෙමු. සවන් දෙමු. විශ්වාසය වර්ධනය කරන්නට ක්‍රියා කරමු.
* ඒ සඳහා අවශ්‍ය බලය ලබන්නට,
  දිනපතා මගේ පැය කරමු.
  නිරන්තරයෙන් ශුද්ධාත්මයාණන් වහන්සේට අවදි වෙමු.
  දේව වචනයෙන් පෝෂණය වෙමු.

06. අවසාන ප්‍රශංසාව :
පුබුදු ගී අංක 49 "යන්න සැරසෙමු...."

**********************